# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.05.07 පැය 0630 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/ 943 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


## ශ්‍රී ජයවධර්නපුර විශ්ව විද්‍යාලයේ ශිෂ්‍යයෙකුට පහරදීමක් සම්බන්ධයෙන් සැකකරුවන් 06 දෙනෙකු අත්අඩංගුවට ගැනීම - හෝමාගම පොලිස් ස්ථානය.

ශ්‍රී ජයවධර්නපුර විශ්ව විද්‍යාලයේ තාක්ෂණ පීඨයේ තුන්වන වසරේ ඉගෙනුම ලබන ශිෂ්‍යයෙකුට එම විශ්ව විද්‍යාලයේම සිසුන් පිරිසක් විසින් හෙල්මට් වලින් හා අතින් පයින් පහරදී තර්ජනය කිරීමක් සම්බන්ධව 2025.04.29 වන දින හෝමාගම පොලිස් ස්ථානයට කරන ලද පැමිණිල්ලක් මත විමර්ශන ආරම්භ කර තිබුණි.

2025.05.06 වන දින මෙම සිද්ධියට සම්බන්ධ තවත් සැකකරුවන් 06 දෙනෙකු හෝමාගම පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් වීමෙන් පසු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 22,23 හා 24 වයස්වල පසු වන කිරිදිවැල, දෙල්ගොඩ, බුත්තල, කුලියාපිටිය හා කලන්කුට්ටිය ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

හෝමාගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කර ගෙන යනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය**